ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## පුවත්පත් නිවේදනය

**දෙනියාය මූලික රෝහල සඳහා වෛද්‍ය උපකරණ ලබා දීමට ඉන්දියාවෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක ප්‍රදානයක්**

දෙනියාය මූලික රෝහලට වෛද්‍ය උපකරණ ලබා දීම සඳහා වන අවබෝධතා ගිවිසුමක් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා විසින් 2026 ජූලි 13 වන දින අත්සන් තබන ලදී. මෙම අවස්ථාව සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා ද සහභාගී විය.

2. මෙම අවබෝධතා ගිවිසුම යටතේ ඉන්දීය රජය විසින් දෙනියාය රෝහලට වෛද්‍ය උපකරණ ලබා දීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක ප්‍රදානයක් ලබා දෙනු ඇත. දැනට ආපද අවදානමක් සහිත ප්‍රදේශයක පිහිටා තිබෙන දෙනියාය මූලික රෝහල ශ්‍රී ලංකා රජයේ විස්තීර්ණ ආපද සූදානම් පියවරක් ලෙස වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිතය. මෙම කර්තව්‍යය වසර තුනක් ඇතුළත සිදු කිරීමට අපේක්ෂිත අතර ඉදිකිරීම්වල අවසාන අදියර වන විට වෛද්‍ය උපකරණ භාර දී සවි කිරීමට සැලසුම් කර තිබේ.

3. මෙම ව්‍යාපෘතිය දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ නැවත ඉදිකිරීමේ සහ පුනරුත්ථාපන පියවර සඳහා සහය ලබා දීමට ඉන්දීය රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක සහන පැකේජයේ කොටසකි.

4. මෙම ප්‍රදානය හරහා සාමාන්‍ය වාට්ටු, HDU ඒකක, හදිසි සහ වෙනම තබන ඒකක, ශල්‍යාගාර, බාහිර රෝගී අංශ, රසායනාගාර, මධ්‍යම විෂබීජහරණ සැපයුම් අංශය (CSSD), විකිරණ සේවා, රුධිර බැංකු, භෞත චිකිත්සක අංශය සහ විශේෂ ප්‍රතිකාර ළදරු අංශය/නව ජන්ම ළදරු ඒකකය ඇතුළු විවිධ වැදගත් අංශ සඳහා අති නවීන වෛද්‍ය උපකරණ ලබා දෙනු ඇත.

5. සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉන්දියා-ශ්‍රී ලංකා සංවර්ධන හවුල්කාරිත්වයේ වැදගත් අංශයකි. දිවයින පුරා ක්‍රියාත්මක 1990 සුව සැරිය ගිලන්රථ සේවය, දික්ඔය ඉදිකළ බහු විශේෂ රෝහල, මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා ශල්‍යාගාරයක් ඉදිකිරීම සහ යාපනය ශික්ෂණ රෝහල සහ කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික් රෝහල් නවීකරණය කිරීම සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඉන්දියාව විසින් සිදු කළ සුවිශේෂී මුලපිරීම් කිහිපයකි. මන්නාරම දිස්ත්‍රික් මහා රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ සැපයීම සහ මුලතිවු දිස්ත්‍රික් මහ රෝහල සඳහා සිවු මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම දැනට ක්‍රියාත්මක සහයෝගීතාවයන් අතර වේ.

***

***කොළඹ***
***2026 ජූලි 14***